www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂය පිහිටුවීමේ සමුලුව පැවැත්වෙයි

## Socialist Equality Party holds founding Congress

**අපගේ වාර්තාකරුවන් විසිනි**
**2008 සැප්තැම්බර් 19 දින**

අගොස්තු මස 03 දින සිට 09 වන දින දක්වා මිචිගන් ප්‍රාන්තයේ ඈන් ආබර්හිදී පැවති එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) පිහිටුවීමේ සමුලුව, හතරවන ජාත්‍යන්තරයේ හා විප්ලවවාදී සමාජවාදී ව්‍යාපාරය ගොඩනැඟීමේ ඓතිහාසික සැතපුම් කනුවක් සලකුනු කරයි.

ආරම්භක සමුලුව, දශකයකට වැඩි කාලයක් පුරා එක්සත් ජනපදය තුලත් ජාත්‍යන්තරවත් ගෙනගිය න්‍යායික, දේශපාලන හා සංවිධානාත්මක වැඩකටයුතු වල ප්‍රතිපලය විය. 1995 ජූනි මාසයේදී සසපයේ පූර්වගාමියා වූ වර්කර්ස් ලීගය, පක්ෂයක් බවට පරිවර්තනය වීමේ ක්‍රියාවලියට මුල පිරීය. 1991 දී සෝවියට් සංගමය විසුරුවා හැරීමත් නොවැලැක්විය හැකි පරිදිම ස්ටැලින්වාදය අපකීර්තියට පත් වීමත්, ඒ හා සමගම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ද ප්‍රතිසංස්කරනවාදී පක්ෂ හා වෘත්තීය සමිති සංවිධාන වල දේශපාලන බංකොලොත් කමත්, ඇමරිකානු හා ලෝක ධනවාදයේ ගැඹුරු වන අර්බුදය මඟින් පෙරලිකාරී වන කම්කරු පන්තියේ හා තරුනයන්ගේ සටන්කාමී කොටස් ද ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය ද අතර සම්බන්ධතාවයේ අති මූලික වෙනකට තුඩු දෙන්නේය යන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (හජාජාක) දෘෂ්ඨිය සසප බෙදා හදා ගනියි.

1998 පෙබරවාරියේදී ලෝක සමාජවාදී වෙබ් අඩවිය දියත් කිරීමත්, එය ඉක්මනින්ම, අන්තර් ජාලය පදනම් කරගත් ලොකයේ වැඩියෙන්ම කියවන සමාජවාදී ප්‍රකාශනය බවට පත්වීමත්, හජාජාක දේශපාලන බලපෑම ප්‍රසාරනය වීමට හා සමාජවාදී සමානතා පක්ෂය තුලට නව සාමාජිකයන් සැලකිය යුතු සංඛ්‍යවකගේ පැමීනීමටත් තුඩු දුන්නේය. තවද. පසුගිය දශකයක කාලය තුල ලෝක ධනවාදයේ දේශපාලන හා ආර්ථික අර්බුදය උග්‍ර අතට හැරීමෙන් සසප ගොඩනඟනැඟීමට පදනම් කරගත් ඉදිරිදර්ශනය සනාථ වී තිබේ.

සතියක් පුරා පැවති සමුලුවට එක්සත් ජනපදයේ හතර වටින්ම පැමිනි නියෝජිතයන් ද, ජාත්‍යන්තර කමිටුවේ, කැනඩාව, බ්‍රතාන්‍ය, ප්‍රංශය, ජර්මනිය, ශ්‍රී ලංකාව, ඕස්ට්‍රේලියාව හා නවසීලන්තයේ නියෝජිතයන් ද සහභාගී විය.

සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික හා ජාත්‍යන්තර පදනම් හා සසප මූලධර්ම පිලිබඳ ප්‍රකාශනය යන ප්‍රධාන ලියවිලි දෙක සමුලුව තුල සාකච්ඡාවට බඳුන්කොට අනුමත කරන ලද අතර ඒවා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පලකරනු ඇත. නියෝජිතයෝ නව පක්ෂ ව්‍යවස්ථාවක් ද අනුමත කලහ.

සසප නව ජාතික කමිටුවක් තෝරා පත් කර ගත් අතර ජෝසෆ් කිෂෝර් නව ජාතික ලේකම් හා ලෝරන්ස් පෝටර් සහකාර ජාතික ලේකම් වශයෙන් ද තේරී පත් වූහ. 1976 පටන් පලමුව වර්කර්ස් ලීගයේ හා පසුව සසප ජාතික ලේකම් වශයෙන් කටයුතු කල ඩේවිඩ් නෝර්ත් නව තනතුරක් වන ජාතික සභාපති ලෙස සමුලුව විසින් පත් කර ගනු ලැබුනි. බැරී ග්‍රේ ලෝසවෙඅ ජාතික ලේකම් වශයෙන් පත්විය.

කොන්ග්‍රසය විසින් සම්මත කල මූලධර්ම පිලිබඳ ප්‍රකාශය තුල, කම්කරු පන්තියේ දේශපාලන ස්වාධිනත්වය, ධනවාදී අර්බුදයේ ස්වභාවය හා සමාජවාදයේ අවශ්‍යතාවය, සමාජවාදය සඳහා අරගලයේ ජාත්‍යන්තර ස්වභාවය, ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීම හා මිලිටරිවාදයටත් යුද්ධයටත් එරෙහි අරගලය හා සමාජවාදී විඥානය සඳහා අරගලයේ වැදගත් කම වැනි ප්‍රශ්න කෙරෙහි සසප මූලික ආස්ථානයන් විස්ථාරනය කලේය.

ප්‍රකාශය මෙසේ සඳහන් කරයි. ''නූතන ධනේශ්වර සමාජයේ ප්‍රධාන හා තීරනාත්මක ජාත්‍යන්තර විප්ලවවාදී සමාජ බලවේගය වන කම්කරු පන්තියේ අවශ්‍යතාවන්, සසප ක්‍රියාමාර්ගය තුල ප්‍රකාශයට පත් කරයි. සසප මූලික කර්තව්‍යය වන්නේ ජාත්‍යන්තර සමාජවාදයේ ක්‍රියාමාර්ගය සඳහා ඇමරිකානු කම්කරුවන්ගේ සහාය දිනා ගැනීමයි. මෙම ක්‍රියාමාර්ගය මත පදනම් වන පක්ෂය, එක්සත් ජනපදය තුල දේශපාලන බලය අල්ලාගෙන කම්කරු රාජ්‍යයක් ගොඩනැඟීම සඳහා කම්කරු පනතිය ඒකාබද්ධ කර මෙහෙයවීමට සටන් වදිනු ඇත. අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී සමානාත්මතා සමාජවාදී සමාජයක් ගොඩනැඟීම සඳහා වෛෂයික පූර්ව කොන්දේසි මේ මඟින් නිර්මානය කරනු ඇත. මෙම අරමුනු සාක්ෂාත් කල හැක්කේ සියලු රටවල කම්කරුවන්ගේ ගෝලීය එකමුතුව හා එකසත් සමාජවාදී රාජ්‍යයන්ගේ ලෝකයක් නිර්මානය කිරීම

අරමුනු කර ගත් ජාත්‍යන්තර මූලෝපායක ආකෘතිය තුල පමනි.''

''සසප මූලධර්ම තුලට, 20 වන සියවසේ අත්‍යවශ්‍ය විප්ලවවාදී නැගිටීම් හා ඊට අනුරූපව ලෝක සමාජවාදී විප්ලවයේ ක්‍රියාමාර්ගය සඳහා මාක්ස්වාදීන් ගෙනගිය අරගලය අන්තර්ගතව ඇති'' බව එය සඳහන් කරයි.

මූලධර්ම පිලිබඳ ප්‍රකාශය, සමාජවාදය සඳහා අරගලයේ ජාත්‍යන්තර පරිමාව අවධාරනය කරයි. ''කම්කරු පන්තියේ විප්ලවවාදී අරගල ප්‍රථමයෙන් පැන නගින්නේ උතුරු ඇමරිකාවේ, දකුනු ඇමරිකාවේ, යුරෝපයේ, ආසියාවේ, අප්‍රිකාවේ හෝ ඕස්ට්‍රේලියාවේ දියුනු හෝ අඩු දියුනු රටක වේවා, සමාජ කලබැගෑනිය අනිවාර්යයෙන්ම ගෝලීය පරිමාවක් අත් කර ගනු ඇත. සමාජවාදී විප්ලවය ජාතික ආකෘතියක් තුල සම්පූර්න කල නොහැකි හා නොවනු ඇත. ට්‍රොට්ස්කි සිය නොනවතින විප්ලවයේ න්‍යාය තල්ල පෙර දුටු ආකාරයට එය පරිපූර්න වන්නේ ලෝක කරලියකය.''

සමාජවාදී මූලෝපායේ අත්‍යවශ්‍ය කරුනු වලට ලියවිල්ල අවධානය යොමු කරයි. ''කම්කරු බලය පිහිටුවීම සඳහා ධනේශ්වර සමාජයේ පවත්නා ආයතන වලට අපේක්ෂකයන් තෝරා පත් කර ගැනීමට වඩා බොහෝ දේ අවශ්‍යය. විප්ලවවාදී මහජන අරගල පැන නැගීමේ තතු තුල, ජනගහනයෙන් කම්කරු පන්තියේ නියෝජිතයන් බහුතරයක් ඇතුලත් වන අව්‍යාජ සහභාගිත්වයකින් යුත්, නව ප්‍රජාතන්ත්‍රීය ආකෘතීන් හා ව්‍යුහයන්, කම්කරුවන්ගේ, කම්කරුවන් සඳහා කම්කරුවන් විසින් යන සංකල්පය මත, කම්කරු ආන්ඩුවක පදනම් ලෙස වර්ධනය කල යුතුය. ආර්ථික ජීවිතයේ සමාජවාදී පරිවර්තනයක් සඳහා අත්‍යවශ්‍ය වූ එම පියවරයන් ගන්නා විට, කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්වය විශාල වශයෙන් පුලුල් කිරීම සඳහා දිරිගැන්වීම් හා ක්‍රියාකාරී ප්‍රචාරනයක් දීම ද, තීන්දු ගැනීමේ ක්‍රියාවලීන් මත පාලනය තබා ගැනීම ද එවන් ආන්ඩුවක ප්‍රතිපත්තිය විය යුතුය. අධිරාජ්‍යවාදී ජනාධිපති තනතුර, සීරුවෙන් තබා ඇති හමුදාව හා ජාතික ආරක්ෂක සංස්ථාව වැනි මහජනතාවට එරෙහි කුමන්ත්‍රනයේ මධ්‍යස්ථාන ලෙස සේවය කරන හෝ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සීමා කරන, පවත්නා ආයතන අහොසි කිරීම වෙනුවෙන් එය පෙනී සිටිය යුතුය. ප්‍රගාඪ ලෙසම ප්‍රජාතන්ත්‍රීය ස්වභාවයක් ගන්නා මේ සියලු අත්‍යවශ්‍ය වෙනස්කම් , ජනතාව විසින්ම තීන්දු කල යුතුය. එය කල හැක්කේ සමාජවාදී විඥානයෙන් පුබුදු කල කම්කරු පනතියේ මහා පරිමාන රැලිවීමකින් පමනි.''

මාක්ස්වාදී න්‍යාය පිලිබඳ වැදගත් කම අවධාරනය කරමින් ප්‍රකාශය මෙසේ පැහැදිලි කරයි. ''එක්සත් ජනපදය තුලත් ජාත්‍යන්තරවත් කම්කරු ව්‍යාපාරයේ දේශපාලන, බුද්ධිමය හා සංස්කෘතික ආයාමයේ ඉමහත් වර්ධනයක්, සමාජවාදය සඳහා අරගලය විසින් ඉල්ලා සිටිනු ලැබේ. තත්කාර්යවාදි හා අවස්ථාවාදී දේශපාලනයේ නියුතු වූවන්ට සපුරා වෙනස් ලෙස සසප, සිය ධජය වෙත කම්කරුවන් දිනාගැනීමේ ද, එය ධනවාදයට එරෙහි අරගලය සඳහා සූදානම් කිරීමේදී ද, ඉන් එහාට සමාජවාදී සමාජයක් ගොඩනැගීමේ ද හැකියාවෙන් යුතු බව සනාථ කරනු ඇත්තේ ඉහලම න්‍යායික මට්ටමක වැඩකරන ව්‍යාපාරයක් පමනක් බව ඒත්තු ගෙන සිටියි.''

දින තුනක් තිස්සේ පැවති සමුලුව විසින් අනුමත කල සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික හා ජාත්‍යන්තර පදනම් පිලිබඳ ලියවිල්ල, හජාජාක මෙන්ම සමාජවාදී සමානතා පක්ෂයේ ද මූලෝපායික අනන්‍යතාවය හා ඉදිරිදර්ශන තීරනය කරන තීරනාත්මක ඓතිහාසික සිදුවීම්, දේශපාලන හා න්‍යායික ගැටුම් ද සමාලෝචනය කලාය. එහි මෙසේ සඳහන් විය.

''විප්ලවකාරී හා සමාජවාදී මූලෝපාය වර්ධනය කල හැක්කේ අතීත අරගලයන්ගේ පාඩම්වල පදනම මත පමනකි. සියල්ලටත් වඩා, හතරවන ජාත්‍යන්තරයේ ඉතිහාසය පිලිබඳ සවිස්තරාත්මක දැනුමක් ලබාදීම දෙසට සමාජවාදීන්ගේ අධ්‍යාපනය යොමු කල යුතුය. සමාජවාදී විප්ලවයේ න්‍යායික හා දේශපාලන හී තුඩ ලෙස මාක්ස්වාදයේ වර්ධනය එහි වැඩි දියුනු ප්‍රකාශනය අත් කර ගන්නේ, ස්ටැලින්වාදයට, ප්‍රතිසංස්කරනවාදයට, ට්‍රොට්ස්කිවාදයේ පැබ්ලෝවාදී සංශෝධනයන්ට හා දේශපාලන අවස්ථාවාදයේ අන් සියලු රූපාකාරයන්ට එරෙහිව 1938 දී එය පිහිටවූ තැන් පටන් හතරවන ජාත්‍යන්තරය විසින් ගෙන ගිය අරගලයන් තුලය.

ක්‍රියාමාර්ගය හා ක්‍රමෝපායන් පිලිබඳ අත්‍යවශ්‍ය ප්‍රශ්න මත පක්ෂය තුල දේශපාලන එකඟතාවය, 20 වන සියවසේ ඓතිහාසික අත්දැකීම් හා ඒවායේ කේන්ද්‍රීය මූලෝපායික පාඩම් පිලිබඳ පොදු අගැයීමකින් තොරව, අත්කර ගත නොහැකිය. කම්කරු පන්තිය එහි ජයග්‍රහනයන්ගේ පමනක් නොව පරාජයන්ගේ ද ඉතිහාසයෙන් ඉගෙන ගන්නා තාක් දුරට පමනක්, විප්ලවවාදී අරගලයන්ගේ නව අවධියක ඉල්ලීම් සඳහා එයට සූදානම් විය හැකිය.''

සිය ආරම්භක වාර්තාව තුල ඩේවිඩ් නෝර්ත් මෙසේ සඳහන් කලේය.

''සමාජවාදී සමානතා පක්ෂයේ මෙම ආරම්භක සමුලුවේ දේශපාලන වැදගත්කම අවබෝධ කර ගත හැක්කේ, එය අත්‍යවශ්‍ය දේශපාලන සන්ර්භයෙහි පිහිටුවා ලන්නේ නම් පමනි. දේශපාලන සංවිධානයක් පිලිබඳ සම්ප්‍රධායික, තත්කාර්යවාදී එනම්, ධනපති හා සුලු ධනපති සංකල්පයෙන්, පක්ෂය පිලිබඳ මාක්ස්වාදී සංකල්පය මුලුමනින්ම වෙනස් වේ. පලමු කී ආස්ථානයට අනුව දේශපාලන පක්ෂයක් පොදුවේ වටහා ගන්නේ, තරමක් වියුක්ත ලෙස නිර්වචනය කල

අරමුනු කිහිපයක් මත ඇති කර ගන්නා එකඟතාවක් සහිත, බොහෝ විට මැතිවරන ව්‍යාපාරයේ ආකෘතිය තුල, එම අරමුනු ඉටුකර ගැනීම සඳහා එකට එක්වූ මිනිසුන්ගේ සංවිධානයක් ලෙසය. ඔවුන්ගේ එම ස්වභාවයටම ගැලපෙන පරිදි, එවන් පක්ෂ වර්ධනය වන්නේ, කාර්යක්ෂම ලෙසින් මැතිවරන කටයුතු වල යෙදිය හැකි විසංවාදී අරමුනු සහිතව වුවත් ඔවුන්ගේ සහභාගිත්වයෙන් ඇමීබාවන් බඳු කන්ඩායම් එකට එකතු කරන සංධානයන් ලෙසය. අඩු තරමින් ප්‍රසිද්ධව තිබෙන වෙනස්කම් සහිත ක්ෂේත්‍රයන් ගැන සඳහන් කරතොත් ඒ පවා උඩින් පල්ලෙනි. ධනේශ්වර දේශපාලන සන්දර්භය තුල පක්ෂ සන්ධානයන් ගොඩ නැගීමේ මෙම ප්‍රවිෂ්ඨය සාර්ථක වන්නේ, ධනේශ්වර දේපල ආරක්ෂා කිරීම, ධනපති ජාතික රාජ්‍යයේ ආරක්ෂාව වැනි ධනේශ්වර පාලනයේ පදනමට සම්බන්ධිත සමහර අත්‍යවශ්‍ය කරුනු සම්බන්ධයෙන් එම පක්ෂ වල එකඟතාවක් ඇති බැවින්ය.''

කෙසේ වුව ද නෝර්ත් තර්ක කලේ සමාජවාදී මෙන්ම කම්කරු ව්‍යාපාරය තුල මෙම ප්‍රවිශ්ඨය යොදා ගැනීම තුඩු දිය හැක්කේ විනාශයකට පමනක් බවටය. ප්‍රංශ පැබ්ලෝවාදී සංවිධානයක් වන ලීග් කොමියුනිස්ට් රෙවලූෂනේය (එල්සීආර්) විසින් පිහිටුවන ලද නව ''ධනපති-විරෝධි පක්ෂය'' පිලිඉඳ නිදසුන ඔහු ගෙන හැර දැක්වීය. 20 වන සියවසේ සමාජවාදය සඳහා අරගලයේ මූලික ඓතිහාසික හා දේශපාලන පාඩම් මත පක්ෂ සාමාජිකයන් අතර එකඟතාවයක අවශ්‍යතාවය එක හෙලා ප්‍රතික්ෂේප කරමින්, ධනපති-විරෝධී පක්ෂයේ නායක ඔලිවර් බෙසන්සිනොට් විසින් කල ප්‍රකාශයක් ගැන සඳහන් කල නෝර්ත් මෙසේ පැවසීය.

''සෑම වචනයක් හා වැකියක් ම තුලින්, වංචනිකත්වයේ, කුහකත්වයේ හා දේශපාලන අවිශ්වාසයේ කුනු ගඳ හමයි. බෙසන්සිනොට්ගේ අරමුන අතීත පාඩම් පිලිබඳ සාකච්ඡාවක් හෝ සමාලෝචනයක් වැලැක්වීමයි. ධනපති-විරෝධී පක්ෂයට, මූලධර්ම වලට කැපවීම මඟින් සිය දෑත් බැඳ ගැනීමට අවශ්‍යතාවක් නොවීය.''

හතරවන ජාත්‍යන්තරය තුල, විශේෂයෙන්ම සසප හිස එසවූ ජාත්‍යන්තර කමිටුව තුල, දේශපාලන අරගලයන් නෝර්ත් විමසා බැලීය. 1982 හා 1985 අතර ජාත්‍යන්තර කමිටුව තුල වැඩී ගිය ගැටුම ඔහු අවධාරනය කලේය. එම වකවානුවේදී ස්ටැලින්වාදීන්ටත්, ප්‍රතිසංස්කරනවාදී කම්කරු නිලධරයන්ටත්, සුලු-ධනපති ජාතිකවාදී සංවිධානවලටත් අනුගත වූ අවස්ථාවාදී ප්‍රවනතාවන්ට හජාජාක තුල සම්භාව්‍ය ට්‍රොට්ස්කිවාදීහු විරුද්ධ වූහ. මේ කිසිදු ප්‍රවනතාවක් ඔවුන් අනුගතව සිටි, ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ බිඳවැටීම හෝ ප්‍රතිසංස්කරනවාදී හා ජාතිකවාදී සංවිධානවල අර්බුදය පූර්ව සංකල්පනය නොකලහ.

එහෙත් ට්‍රොට්ස්කිවාදී විප්ලවවාදී ඉදිරිදර්ශනය ආරක්ෂා කල අය, සිය වැඩ කටයුතු ඓතිහාසික වර්ධනයේ අත්‍යවශ්‍ය ක්‍රියාවලීන් සමඟ නිවැරදිව අනන්‍ය කර ගැනීමට සමත් වූහ. නෝර්ත් මෙසේ සඳහන් කලේය. ''හජාජාක, තාක්ෂනයේ වර්ධනය සමඟ අත්වැල් බැඳගත් ආර්ථික භූගෝලීයකරනයේ විප්ලවවාදී ශක්‍යතාවය හා ඇඟවුම් මත ද, පන්ති අරගලයේ ජාත්‍යන්තර ඒකාබද්ධතාවය දෙසට වූ ප්‍රවනතාවය මත ද, දැවැන්ත දේශපාලන බරක් යෙදීය. ඒ සමඟම, වෙලඳපොලේ භාෂාව යොදා ගනිමින් අපි, ඇමරිකානු ධනවාදය හා ගෝලීය ආධිපත්‍යය සඳහා එහි තල්ලුව බෙහෙවින් ලඝු කොට දැක්වූයෙමු.''

ආරම්භක සම්මේලනය සඳහා බැරෑරුම් ලෙස සූදානම් වීම මඟින්, උග්‍ර වන ආර්ථික හා දේශපාලන අර්බුදයේ කාල පරිච්ඡේදයක උත්සුකයන් සඳහා සසප හැඩ ගස්වන ලද බව ද නෝර්ත් සඳහන් කලේය. ''වර්ධනය වන අර්බුදය, පුලුල් ඇමරිකානු කම්කරු ජන සමූහයේ ජීවන කොන්දේසි අති මූලික වෙනසකට බඳුන් කරනු ඇත. ඇමරිකානු ධනවාදයේ ගෝලීය තත්වයෙහි දිග් ගැස්සුනු පරිහානියේ ප්‍රති විපාකයන්, සිය ප්‍රකාශනය ලබාගනු ඇත්තේ විප්ලවවාදී මහජන අරගල වැඩී යාම තුලය.''

''ඇමරිකානු ධනවාදයේ පරිහානියෙහි විප්ලවවාදී ඇඟවුම්'' නම් වූ සිය දේශපාලන වාර්තාව තුල බැරී ග්‍රේ මෙම තේමාවන් පොහොසත් කලේය. ධනේශ්වර අර්බුදයේ වෛෂයික වර්ධනය, ඇමරිකානු කම්කරු පන්තියේ දේශපාලන පෙරලිකාරිත්වය තුල එහි ප්‍රකාශනය සොයාගනු ඇති බව ග්‍රේ අවධාරනයෙන් ප්‍රකාශ කලේය.

''සත්තකින්ම අප මෙම සම්මේලනය පවත්වනු ලබන්නේ ලෝක ඉතිහාසයෙහි ප්‍රධාන සන්ධිස්ථානයක දීය. එක්සත් ජනපද නිවාස හා නය බුබුල පුපුරා යාම, මහා අවපාතයෙන් පසුව එලඹෙන දැවැන්තම මූල්‍ය අර්බුදය බවට වේගයෙන් පරිවර්තනය වීම ගැන පුලුල් එකඟතාවක් පවතියි.'' ග්‍රේ එසේ පැවසීය.

පසුගිය වසරක කාලය තුල වැඩී ගිය මූල්‍ය අර්බුදය, අතිශය නග්න ආකාරයකින් හෙලිදරව් කර ඇත්තේ එක්සත් ජනපදයෙහි ඉමහත් පරිහානිය බව ඔහු පැවසීය. ''දශක ගනනාවක අභ්‍යන්තර දිරාපත්වීමේ ක්‍රියාවලියක ප්‍රතිපලය මතුපිට වැස්ම ඇදුරු කර ගෙන ලෝකයාගේ දෑස හමුවට පැමිනි අතර, එය ඓතිහාසිකව පෙර නොවූ විරූ ආකාරයකට මූල්‍ය පරපුටුභාවයේ හා සාපරාධිත්වයේ මට්ටම එලිමහනට ගෙන ආවේය.''

''එවන් වෙනස්කම් සිදුවන වේගය හා එහි ප්‍රචන්ඩ ස්වභාවය, පැරනි මිත්‍යාවන්ගේ තරම හා බිඳී ගිය එම

සිහින ලෝකයේ පරිමාව කෙරෙහි සමානුපාතික සම්බන්ධයක් පෙන්නුම් කල යුතුය. පාලක පන්තිය දේව වාක්‍යයක් ලෙස නිරතුරුව දේශනා කල, නිදහස් වෙළඳපොල, පුද්ගලික ව්‍යවසායකත්වය හා පුද්ගල ස්වයං විශ්වාසය සුනු විසුනු කරමින් දශලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ට සිය නිවාස අහිමි කල, දුප්පත්කම, විරැකියාව, රෝග පීඩා හා නූගත්කම වැඩි දියුනු වෙද්දී වෝල් වීදියේ යෝධයන්ට ඇප දීමට ඩොලර් ට්‍රිලියන ගනන් වැය කිරීමට සිදුවන තතු තුල ඇමරිකානු සමාජය මත පන්ති බෙදීම්හි ආධිපත්‍යය තවදුරටත් වසංකල නොහැකිය.''

නව ලෝක යුද්ධයක තර්ජනය ද ඇතුලු ලෝක ධනවාදය අස්ථායී කරන මූලික සාධකය ඇමරිකානු අධිරාජ්‍යවාදය බවට පත්ව ඇති ආකාරය ග්‍රේ පැහැදිලි කලේය. '' ජෝර්ජියාව හා රුසියාව අතර යුද්ධයක් ඇවිලී යාම හා ඒ තුල වඩාත් පුලුල් ගැටුමක් ඇවිලී යාමේ ඉතා පැහැදිලි ඇඟවුම් ගැබ්වී පැවතීම, ඇමරිකානු අධිරාජ්‍යවාදය සිය අර්බුදය විසඳගැනීමේලා යොදාගන්නා අපරීක්ෂාකාරී හා යුදවාදී විධික්‍රම හරහා අධිපතිවාදී විදෙස් පිලිවෙතක් අනුගමනය කිරීමට දරන උත්සාහයේ ඇඟවුම් පිලිබඳ එක් මෑත නිදසුනක් පමනි.''

මෙම වර්ධනයන් සසප සම්බන්ධයෙන් දරන වැදගත් කම අවධාරනය කරමින් ඔහු මෙසේ පැවසීය. ''එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂය පිහිටුවීමේදී, කම්කරු පන්තියේ දේශපාලන දිශානතියෙහි මාරුවක් අපි පූර්වාපේක්ෂා කලෙමු. ලෝක දේශපාලන තත්වයේ හා එක්සත් ජනපදය තුල එහි ඇඟවුම් පිලිබඳ ඓතිහාසික හා භෞතිකවාදී විශ්ලේෂනයක පදනම මත අපි විශ්වාසයෙන් යුතුව මහා පරිමාන පන්ති අරගලයේ නව අවධියක් අපේක්ෂා කරමින් ඊට සූදානම් වීමු.''

© www.wsws.org